NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 09 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 12 ඒකකය |
| --- | --- | --- |

## අටලෝ දහම

## I කොටස

- **සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නින්දා ප්‍රශංසා දෙකෙහි දීම නුවණැති තැනැත්තා හැසිරිය යුත්තේ කෙසේද?
   (1). වාතයෙන් නොසෙල්වෙන ගල් පර්වතයක් මෙනි
   (2). මඩෙහි සිටුවන ලද දණ්ඩක් මෙනි
   (3). මහා සාගරයට සියලු ගංගා ජලය ගලන්නාක් මෙනි
   (4). මිරිදිය කෙතරම් එක් වුවද සාගර ජලය කරදිය වන්නාක් මෙනි

02. "ඵුට්ඨස්ස ලෝකධම්මේහි" යනාදී ගාථාවන් අනුව අටලෝ දහමෙහි කම්පා නොවීමේ උතුම් ගුණය පිළිබඳ සඳහන් වන සූත්‍ර ධර්ම දේශනාව කුමක්ද?
   (1). රතන සූත්‍ර දේශනාව
   (2). මහා මංගල සූත්‍ර දේශනාව
   (3). සිගාලෝවාද සූත්‍ර දේශනාව
   (4). කරණීය මෙත්ත සූත්‍ර දේශනාව

03. මානසික දුක් නැතිකර, කායික දුක් පීඩාවලට ගොදුරු විය හැකි පිරිස පමණක් අයත් පිළිතුර වන්නේ,
   (1). බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා
   (2). දෙවිවරු, බ්‍රහ්මයින්, ගාන්ධර්වයින්
   (3). දෙමාපියන්, ගුරුවරුන්, වැඩිහිටියන්
   (4). රජවරු, සිටුවරු, මැති ඇමතිවරු

04. බුදුරජාණන් වහන්සේගේ කීර්තිය කෙරෙහි උරණව, අසත්‍ය චෝදනා නැගුවන් අතරට අයත් නොවන්නේ මින් කවුරුන්ද?
   (1). මාගන්ධියා (2). රජ්ජුමාලා (3). චිංචිමානවිකා (4). සුන්දරී පරිබ්‍රාජිකා

05. ධර්මයට අනුව ලාභයක් ලැබෙන අවස්ථාවක දී අපේ මනසින් ඊට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද?
   (1). මධ්‍යස්ථව
   (2). විචාරයකින් තොරව
   (3). දැඩි ලෙස දුක් වෙමින්
   (4). උද්දාමයට පත්වය

06. අටලෝ දහමට අයත් නොවන්නේ,
   (1). ලාභය (2). අයස (3). ප්‍රශංසා (4). සමාධිය

07. අප සැමගේ ජීවිතයට අටලෝ දහමෙහි වන බලපෑම බොහෝ ධර්ම විග්‍රහයන්වලදී උපමාකර ඇත්තේ කුමකටද?
   (1). කරත්තයක කරකැරෙවන රෝදයකටය
   (2). සුළඟ හමායන ආකාරයටය
   (3). මුහුදු රළ පෙරළෙන ආකාරයටය
   (4). සෙවනැල්ල පිටුපස එනවා මෙනි

Agaram.l - Keep your dreams alive!
Agaram.l - Keep your dreams alive!

08. බුදුරජාණන් වහන්සේට ජීවිත අවසාන භාගයේදී වැළඳුන රෝගාබාධය වන්නේ,

(1). හිසේරදයයි
(2). තුනටියේ වේදනාවයි
(3). මහපට ඇඟිල්ලේ වේදනාවයි
(4). ලේ අතීසාරයයි

09. බුදුරදුන් ජීවමාන සමයෙහි බලවත් රාජ්‍යයක් පවත්වාගෙන ගොස් අවසාන කාලයේ අම්බලමක මියගිය රජතුමා වන්නේ,

(1). බිම්බිසාර රජතුමාය
(2). කොසොල් රජතුමාය
(3). අජාසත් රජතුමාය
(4). ධර්මාශෝක රජතුමාය

10. තමාගේ ධනය පනස්හතර කෝටියක් වියදම් කර බුදුරජාණන් වහන්සේට ආරාමයක් පූජා කොට බොහෝ පිං කර ජීවිත අවසාන කාලයේ දුප්පතෙකු ලෙස මියගිය සිටුතුමා කවුරුන්ද?

(1). කුම්භඝෝෂක සිටුතුමා
(2). අනාථපිණ්ඩික සිටුතුමා
(3). මහානාම සිටුතුමා
(4). ඒකසාටක සිටුතුමා

## II කොටස

- **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. I. අෂ්ට ලෝක ධර්මය යනු කුමක්ද?
II. අෂ්ට ලෝක ධර්මය පිළිවෙළින් නම් කරන්න.
III. අටලෝ දහම පිළිබඳ පැහැදිලි කරන්න.

02. I. ''ඵුට්ටස්ස ලෝක ධම්මේහි....'' ඔයන ගාථාව සම්පූර්ණ කරන්න.
II. එම ගාථාවේ අදහස ලියන්න.
III. ලොව උපන් සෑම පුද්ගලයාටම අටලෝ දහමට මුහුණදීමට සිදුවන බව විස්තර කරන්න.

03. I. ''සේලෝ යථා ඒකඝනෝ.....'' යන ගාථාව සම්පූර්ණ කරන්න.
II. එහි සරල අදහස ලියන්න.
III. සමාජ, පුද්ගල ජීවිත ගැටලුවලදී නොසැලී මුහුණදෙන අයුරු පැහැදිලි කරන්න.

04. I. මානසික දුක් නැති උතුමන් කවුරුන්ද?
II. බුදුරජාණන් වහන්සේට කායික දුක් වේදනා පැමිණි අවස්ථා හතරක් නම් කරන්න.
III. ඉන් එක් අවස්ථාවක් පැහැදිලි කරන්න.

05. I. බුදුරජාණන් වහන්සේට සිව්පසයෙන් සංග්‍රහ කළ පුද්ගලයින් හතරදෙනෙකු නම් කරන්න.
II. බුදුරජාණන් වහන්සේට නින්දා අපහාස කළ පුද්ලයින් හතරදෙනෙකු නම් කරන්න.
III. නින්දා ප්‍රශංසා හමුවේදී අප ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

Agaram.l - Keep your dreams alive!
Agaram.l - Keep your dreams alive!